## නිපුණතා මට්ටම 1.3 : නෘත්ත, නෘත්‍ය හා නාට්‍ය

ක්‍රිස්තු පූර්ව තුන්වැනි සියවසේ පමණ රචිත නාට්‍ය කලාවේ මූලග්‍රන්ථයක් සේ සැලකෙන භරත මුණිවරයාගේ "නාට්‍ය ශාස්ත්‍රය" හි මෙම තෙවැදෑරුම් "රඟුම් විශේෂ" ගැන මනාව විග්‍රහකර ඇත. " නෘත්" හෝ "නට්" යන මූල ධාතුවෙන් මෙම පද තුන ම බිහි වී ඇතත්, ඒවායේ අර්ථ එකිනෙකෙන් වෙනස් ය. ඒ ගැන පැහැදිලි කර ගනිමු.

### නෘත්ත

"නෘත්ත" යනු අංග වික්ෂේප භාවිත කරන, රිද්මයානුකූල හා ශෝභමාන දෘශ්‍ය රූපයක් සහිත තාලාන්විත නැටුමකි. එහි ඇත්තේ නර්තනයක් පමණි. නෘත්ත වල කිසිදු අර්ථයක් හෝ හැඟීම් ප්‍රකාශනයක් නොදක්වෙන අතර, ඒ සඳහා ලී කෙළි, කලගෙඩි නැටුම් වැනි නර්තනාංග නිදසුන් ලෙස සැලකිය හැකි ය.

එක ගසකින් ලී යයක් කපා ගෙන - එක උස ඇති සදෙනෙක් තෝරා ගෙන
ගුරුන් අතට දී ලී බෙදවාගෙන - අපින් කෙළිමු ලී දෙපිළ බෙදී ගෙන
තාන තනා තම්දෙ නා තම්දෙ තම්දෙ නා නා - තතන තනා තම්දෙ නා තම්දෙ නා නා//






### නෘත්‍ය

"නෘත්‍ය" යනු රංගන මගින් කිසියම් අර්ථයක් හෝ භාවයක් දක්වෙන තාලාන්විත නර්තනාංගයකි මෙහි දී ආංගික, සාත්ත්වික මෙන් ම ආහාර්ය අභිනය භාවිත වේ. නිදසුන් වශයෙන් භරත නාට්‍යම් හී රාධා ක්‍රිෂ්ණා, ශිව පාර්වතී, රාමා සීතා නිරූපණය කෙරෙන නර්තන විලාසයන් දක්විය හැකි ය. මුද්‍රා නාට්‍යය අයත් වන්නේ ද නෘත්‍ය අංගයන් යටතට ය. නෘත්‍ය අංග ස්වාධීනව හමු නොවුන ද අපගේ ශාන්ති කර්ම තුළ අඩංගු යම් යම් රඟපෑම් අවස්ථා බෙහෙවින් දැකිය හැකිය.





නාට්‍ය

“නාට්‍යය” සඳහා සතර අභිනය ම යොදා ගැනේ. කිසියම් කතා පුවතක්, සිදුවීමක් හෝ අවස්ථාවක් නාට්‍යයක් සඳහා පාදක කර ගන්නා අතර, නාට්‍යයක් යනු අපූර්ව අවස්ථාවන් ගෙන් යුතු ව මුල, මැද, අග සහිතව ගොනු කොට ඇති, ආනුෂංගික කලාවන්ගේ සංකලනයෙන්, විවිධ ස්ථානවල දීර්ඝ කාලයක් තිස්සේ සිදුවන්නා වූ දේ එක් ස්ථානයක සම්පිණ්ඩනය කර දක්වන්නක් ලෙස හැඳින්විය හැක.




